රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.05.15**

**නිවේදන අංකය: 470 /2021**
**නිකුත් කළ වේලාව:22:45**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ**
**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු**

**<u>අද කොවිඩ් මරණ 20 යි</u>**

2021 මැයි 07 දින සිට මැයි 15 දක්වා සිදුව ඇති කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 20 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අද (15) තහවුරු කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන මුළු කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ සංඛ්‍යාව 941 කි.

01. පන්විල ප්‍රදේශයේ පදිංචි 67 හැවිරිදි කාන්තාවකි. මහනුවර ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 මැයි 11 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

02. කැලණිය ප්‍රදේශයේ පදිංචි 60 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 08 වන දින කිරිබත්ගොඩ මූලික රෝහලට ඇතුළත් කරන අවස්ථාව වන විට මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව,ආඝාතය, දියවැඩියාව තත්වයයි.

03. බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචි 61 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 12 වන දින නිවසේ දී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් 19, ලය ආසාදනය සහ සංකූලතා, දියවැඩියාව සහ හෘද රොගී තත්වයයි.

04. ගෝනපොල ප්‍රදේශයේ පදිංචි 87 හැවිරිදි කාන්තාවකි. 2021 මැයි 13 වන දින නිවසේ දී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ උග්‍ර කොවිඩ් නියුමෝනියාවයි.

05. ගම්පහ ප්‍රදේශයේ පදිංචි 70 හැවිරිදි පුරුෂයෙකි. වැලිකන්ද විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 මැයි 14 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ උග්‍ර කොවිඩ් නියුමෝනියාවයි.

06. කලවාන ප්‍රදේශයේ පදිංචි 71 හැවිරිදි පුරුෂයෙකි. කලවාන රෝහලේ සිට පිඹුර මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 මැයි 15 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

07. පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචි 73 හැවිරිදි පුරුෂයෙකි. වැලිකන්ද විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 මැයි 14 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ උග්‍ර කොවිඩ් නියුමෝනියාවයි.

08. අඹතැන්න ප්‍රදේශයේ පදිංචි 72 හැවිරිදි කාන්තාවකි. කටුගස්තොට රෝහලේ සිට මහනුවර ජාතික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 මැයි 15 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

09. කුණ්ඩසාලේ පදිංචි 65 හැවිරිදි කාන්තාවකි. මහනුවර ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 මැයි 14 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

10. උතුරු කළුතර ප්‍රදේශයේ පදිංචි 75 හැවිරිදි කාන්තාවකි. කළුතර මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර 2021 මැයි 15 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

11. පොලොන්නරුව ප්‍රදේශයේ පදිංචි 76 හැවිරිදි කාන්තාවකි. පොලොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි 15 වන දින කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් මරණයට පත්වී ඇත.

12. නවුත්තුඩුව ප්‍රදේශයේ පදිංචි 75 හැවිරිදි කාන්තාවකි. කළුතර දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි 14 වන දින කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් මියගොස් ඇත.

13. මග්ගොන ප්‍රදේශයේ පදිංචි 78 හැවිරිදි කාන්තාවකි. කළුතර දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි 15 වන දින කොවිඩ් නියුමෝනියාව හේතුවෙන් මියගොස් ඇත.

14. කොළඹ 13 ප්‍රදේශයේ පදිංචි 68 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 13 වන දින කොළඹ ජාතික රෝහලට ඇතුලත් කරන අවස්ථාවේදී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව, හෘදරෝගී තත්වය සහ දියවැඩියා තත්වයයි.

15. රුවන්වැල්ල ප්‍රදේශයේ පදිංචි 83 හැවිරිදි පුරුෂයෙකි. කරවනැල්ල මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් 2021 මැයි 12 වන දින මියගොස් ඇත.

16 වවුනියාව ප්‍රදේශයේ පදිංචි 79 හැවිරිදි කාන්තාවකි. වවුනියාව දිස්ත්‍රික් රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 මැයි 14 වනදින කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් මියගොස් ඇත.

17. කොළඹ - 14 ප්‍රදේශයේ පදිංචි 63 හැවිරිදි පුරුෂයෙකි. 2021 මැයි 14 වන දින නිවසේදී මිය ගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව සහ මස්තිෂ්ක වාහිනී රෝගය.

18. නැබොඩ ප්‍රදේශයේ පදිංචි 65 හැවිරිදි පුරුෂයෙකි. හොරණ මූලික රෝහලේ සිට ඉත්තෑපාන දිස්ත්‍රික් රෝහල වෙත ඇතුලත් කර ඇත. එහිදී 2021 මැයි 07 වන දින කොවිඩ් නියුමෝනියා තත්වය හේතුවෙන් මියගොස් ඇත.

19. දියතලාව ප්‍රදේශයේ පදිංචි 66 හැවිරිදි පුරුෂයෙකි. දියතලාව මූලික රෝහලේ සිට බදුල්ල මහ රෝහල වෙත මාරුකර යවා ඇත. එහිදී 2021 මැයි 15 වන දින උග්‍ර කොවිඩ් නියුමෝනියාව සහ පාලනය නොවූ දියවැඩියා රෝගය හේතුවෙන් මියගොස් ඇත.

20. පස්සර ප්‍රදේශයේ පදිංචි 70 හැවිරිදි පුරුෂයෙකි. පස්සර රෝහලේ සිට බදුල්ල මහ රෝහල වෙත මාරු කර යවා ඇති අතර එහිදී 2021 මැයි 15 වන දින උග්‍ර කොවිඩ් නියුමෝනියාව සහ ස්නායු රෝගී තත්වයක් හේතුවෙන් මියගොස් ඇත.



**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**